# ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1973 මැයි මස 9 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1973 මැයි මස 18 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර
දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත

[සහතිකය සටහන් කළේ 1973 මැයි මස 9 වන දින]

එල්.ඩී.—ඕ. 2/73.

සිරකරු ශුභ සාධක අරමුදලක් පිහිටුවීම සඳහාත් සිරකරුවන්ගේ පොදු ශුභ සිද්ධිය සඳහා ඒ අරමුදලින් මුදල් වියදම් කිරීම සඳහාත් විධිවිධාන සැලැස්වීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඩු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 18 දරන බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල පිහිටුවීම.

2. (1) මේ පනතේ කාර්යයන් සඳහා, (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ සිරකරු ශුභ සාධක අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබේ.

(2) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයෙන් අරමුදලේ පොදු ගිණුමක් පවත්වාගෙන යා යුතු ය.

අරමුදලේ පාලනය සහ කළමනාකරණය.

3. අරමුදලේ පාලනය සහ කළමනාකරණය බන්ධනාගාර කොමසාරිස්වරයා වෙත පැවරෙන්නේ ය.

අරමුදල වෙත කරනු ලබන ගෙවීම.

4. පහත සඳහන් මුදල් අරමුදලේ ගිණුමට බැර කළ යුතුය :—

(අ) මේ පනත ක්‍රියාත්මක වන දින බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගණින් පොත්වල දැක්වෙන පරිදි "සිරකරු ශුභ සාධක අරමුදලේ පොදු තැන්පත් මුදල් ගිණුමෙහි" බැරට ඇති සියලු මුදල් ;

(ආ) විනෝදාංශ ද්‍රව්‍ය විකිණීමෙන් ලැබෙන ශුද්ධ අය මුදලින් ලේකම් විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි කොටස ;

(ඇ) සිරකරුවන්ගේ වැටුප්වලින් කපා ගන්නා අනිවාර්ය අය කිරීම ;

(ඈ) සිරකරුවන්ගේ ශුභ සාධනය සඳහා මහජනයා විසින් කරනු ලබන යම් පරිත්‍යාග ;

(ඉ) බන්ධනාගාර කම්කරුවන්ගේ සේවය සැපයීම සඳහා අය කිරීම් වශයෙන් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවලින් සහ වෙනත් ආයතනවලින් අයකර ගනු ලබන මුදල් කිසිවක් ;

(ඊ) බලය නොලබා සිරකරුවන්ගේ සන්තකයෙහි තබාගෙන තිබී, සොයාගන්නා ලද යම් මුදල් ;

(උ) බන්ධනාගාර ස්ථානයෙහි තිබී සොයා ගන්නා ලද අයිතිය ඔප්පු නො වූ යම් මුදල් ;

2—ජේ 21031—9.057 (73/3)

(ඖ) (i) බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන විකුණුම් කාමරයෙන්,

(ii) සිරකරුවන් විසින් සාදන ලද විනෝදාංශ ද්‍රව්‍ය ප්‍රදර්ශනය කිරීමෙන්, සහ

(iii) බන්ධනාගාරයෙහි පවත්වාගෙන යනු ලබන ආපන ශාලාවලින්

ලැබෙන ශුද්ධ ලාභ ; සහ

(එ) මුදල් විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් විසින් අනුමත කරනු ලැබිය හැකි, අරමුදලට ලැබෙන වෙනත් ආධාර මුදල්.

අරමුදලින් මුදල් වියදම් කිරීම.

5. අරමුදලේ බැරට ඇති මුදල්, ලේකම් විසින් කලින් කල නිකුත් කරනු ලබන උපදෙස්වලට යටත්ව පහත සඳහන් කාර්ය යන්ගෙන් යමක් සඳහා වියදම් කිරීමට බන්ධනාගාර කොමසාරිස් වරයාට බලය ඇත්තේ ය:—

(අ) සිරකරුවන්ගේ අධ්‍යාත්මික සහ ආගමික ශුභ සිද්ධිය ;

(ආ) සිරකරුවන්ගේ අධ්‍යාපනික ශුභ සිද්ධිය ;

(ඇ) සිරකරුවන් සඳහා විනෝද ක්‍රීඩා පහසුකම් සහ වෙනත් සැප පහසුකම් සැලැස්වීම ;

(ඈ) සිරකරුවන්ට තෑගි දීම ;

(ඉ) ප්‍රදර්ශන සංවිධානය කිරීම සහ සිරකරුවන් සඳහා ආපන ශාලා පවත්වාගෙන යාම පිණිස, ආපසු ගෙවිය හැකි අත්තිකාරම් ගෙවීම.

මුදල් වර්ෂය.

6. අරමුදලේ කාර්යයන් සඳහා වූ මුදල් වර්ෂය ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භ ව දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන වර්ෂය වන්නේ ය.

ගණන් සහ විගණනය.

7. (1) අරමුදලේ ගණන් විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.

(2) එක් එක් මුදල් වර්ෂය අවසන් වීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අරමුදලේ කටයුතු සිදු වූ ආකාරය දක්වන්නා වූ ද අරමුදලේ කටයුතුවලට සම්බන්ධ සියලු ගණුදෙනුවල පූර්ණ විස්තර අඩංගු වූ ද පූර්ණ ප්‍රකාශයක් බන්ධනාගාර කොමසාරිස්වරයා විසින්, විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පිටපතක් ද සමග අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය. අමාත්‍යවරයා විසින් හැකි පහසු ඉක්මණින් එකී වාර්තාව ජාතික රාජ්‍ය සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

අර්ථ නිරූපණය.

8. මේ පනතෙහි "ලේකම්" යන්නෙන් බන්ධනාගාර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් අදහස් වේ.